02. වර්ෂ 2013.01.11 වැනි දින සිට 2013.01.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.02.01 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේ පත්තුවේ සල්පිටි කෝරළයේ නාවල 5 වැනි පටුමග පිහිටි වරි. අංක 65 දරන "කුරුඳුගහවත්තේ වෙල " ඉඩමෙන් බෙදා වෙන්කළ අංක බී දරන | 01. කේ. පී. ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1996.10.17 දින අංක 394 දරන විකුණුම්කරය. |

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| දරන කොට්ඨාසයේ 2185 වෙළුමේ 91 පත්‍රිරුව. | කැබැල්ලට කේ. ජී. ජී. පියසේන බලයලත් මානක තැන විසින් 1996.10.01 වැනි දින මැන සාදන ලද අංක 517 පිඹුර ප්‍රකාර මායිම්, උතුර : දියපොරගහ කුඹුර හා තුඩුවේ කුඹුර නැගෙනහිර : ලොට් 1ඩී දකුණ : ලොට් 1සී බස්නාහිර : පස්වන පටුමග ව. අ. 63 ප්‍රමාණය : අක්. 0, රූ. 0, පර්. 10 | 02. කේ. පී. ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1997.08.19 දින අංක 479 දරන වරද නිවැරදි කිරීමේ ඔප්පුව. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

01-525

---

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත හා 1999 අංක 29 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර ඇති බව දන්වමින් 2012 සැප්තැම්බර් මස 28 වැනි දින *රජයේ ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධ කරන ලද නිවේදනයේ අංක 04 යටතේ සඳහන් කරන ලද තොරතුරු පහත සඳහන් අයුරින් සංශෝධනය කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

*පැරණි නිවේදනය :*

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම හා ලිපිනය* |
|---|---|---|
| 04 42333 | වීරරත්න මාතර මහවිදාන මුහන්දිරම්ගේ දයානන්ද මහතා, අංක 130, බොරාල පාර, වැල්ලක්ක, වැලිගම. | 1. සුරංග ප්‍රසාද් හීනටිගල මහතා, අංක 22, අග්‍රබෝධි මාවත, වැලිගම.<br>2. මනමාල ආරච්චිගේ සුසිල් මහතා, අංක 43, බටවල ජනපදය, වැලිගම. |

*සංශෝධිත නිවේදනය*

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමියාගේ නම හා ලිපිනය* |
|---|---|---|
| 04 42333 | වීරරත්න මාතර මහවිදාන මුහන්දිරම්ගේ දයානන්ද මහතා, අංක 130, බොරාල පාර, වැල්ලක්ක, වැලිගම. | 1. සුරංග ප්‍රසාද් හීනටිගල මහතා, අංක 22, අග්‍රබෝධි මාවත, වැලිගම. |

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2013 ජනවාරි මස 03 වැනි දින,
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ දී ය.

01-514

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී -අම්බලන්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය

ගෝනපිනුවල විතානගේ හර්බට්.

වර්ෂ 2012 ක් වූ අගෝස්තු මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඩේවිඩ් විසින් 2007 ක් වූ අප්‍රේල් මස 24 වැනි දින ලියා සහතික කරන ලද අංක 2888 දරන බැඳුම්කරයේ සඳහන් නිශ්චල දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 සැප්තැම්බර් මස 03 වැනි දිනට යෝජනා සම්මුතිය ප්‍රකාර බලයලත් වෙන්දේසිකරු හේමචන්ද්‍ර දළුවත්ත වෙත පැවරනු ලැබූ බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට ද, එකී 2888 දරන බැඳුම්කරය යටතේ දේපල කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ යන අය ලවා වෙන්දේසියේ විකිණීමට බලය පැවරීමට ද, එකී 2009 සැප්තැම්බර් මස 03 වැනි දින දරන සම්මුතිය මෙම නව යෝජනා සම්මුතියේ සඳහන් වන තාක් දුරට සංශෝධනය කිරීමටත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,<br>
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),<br>
සමාගම් ලේකම්.

01-575

---

### මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 අගෝස්තු මස 24 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගනු ලැබූ බව මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මදූෂි ඩී. ධර්මරත්න මෙනවිය විසින් සහතික කරන ලද 2011.06.17 දින අංක 45 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම අංක පීවී 15727 යටතේ ලියාපදිංචි වී ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වූ බ්ලිස් ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින්ද, එකී අංක 45 දරන උකස් බැඳුම්කරය මත දැනට මහජන බැංකුව වෙත රු. 15,000,000 (රුපියල් මිලියන පහළොවක් වූ) මුදලක් අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද 2012.01.18 දින සිට වෙන්දේසි දිනය දක්වා එකී රු. 15,000,000 (රුපියල් මිලියන පහළොවක්) වූ මුදලක් මත වර්ෂයකට සියයට පහළොවක් (15%) පොළී මුදලක් ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් සිදුකර ඇත්නම් එම ගෙවීම අඩු කිරීමෙන් පසුව සහ වෙනත් විකිණීමේ පිරිවැය සහ ගාස්තු ද සමග එකී රු. 15,000,000 (රුපියල් මිලියන පහළොවක් වූ) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 45 දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී මහජන බැංකුව වෙත උකස් කරන ලද දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු වන අර්වින් පෙරේරා මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහනගර සභා සීමාව ඇතුළත කච්ඩාන, පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු අයි. ඩබ්. ඩබ්. ඉන්ද්‍රතිස්ස විසින් සාදන ලද 1995.07.06 දින අංක 1915 දරන පිඹුරේ සහ 1955.07.03 දින අංක 1915A දරන පිඹුරේ නිශ්චිතව දක්වා ඇති ලොට් A සහ ලොට් B ඒකාබද්ධකර සාදන ලද උපබෙදුමක් වූ "කොස්ගහවත්ත" යන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු වන සී. පීරසිංහ විසින් සාදන ලද 2004.05.05 දින අංක 2157 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කර ඇත්තා වූ කවුඩාන පාර වරිපනම් අංක 140/5 දරන, උතුරට : ලොට් අංක 1 ද, නැගෙනහිරට : ලොට් අංක 5 ද, දකුණට : ලොට් අංක 3 ද, බටහිරට : කච්ඩාන පාරේ වරිපනම් අංක 138/1 යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද එකී අංක 2157 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ 0, පර්. 8.00) හෙවත් හෙක්ටයාර් 0.0202 ක් වූ දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M 2822/07 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

ඉහත කී කච්ඩාන පිහිටා ඇත්තා වූ ද, "කොස්ගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු වන සී. පීරසිංහ විසින් සාදන ලද 2004.05.05 දින අංක 2157 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 2 ද, නැගෙනහිරට : ලොට් අංක 5 ද, දකුණට : ලොට් 4 ද, බටහිරට : කච්ඩාන පාරේ වරිපනම් අංක 138/1 ද, මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද එකී අංක 2157 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ, 0, පර්. 8) හෙවත් හෙක්ටයාර් 0.0202 ක් වූ ද දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ M2822/08 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

ඉහත කී කච්ඩාන පිහිටා ඇත්තා වූ ද, "කොස්ගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු වන සී. පීරසිංහ විසින් සාදන ලද 2004.05.05 දින අංක 2157 දරන පිඹුරේ ලොට් අංක 4 ලෙස ලකුණු කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 3 ද, නැගෙනහිරට : ලොට් අංක 5 සහ ඩී. පෙරේරා මහතාගේ ඉඩම ද, දකුණට : කච්ඩාන පාරේ වරිපනම් අංක 142/3 ද, බටහිරට : කච්ඩාන පාරේ වරිපනම් අංක 138/1 සහ කච්ඩාන පාරේ වරිපනම් අංක 136/99 ද මායිම් තුල පිහිටා ඇත්තා වූ ද එකී අංක 2157 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0, රූ, 0, පර්. 18) හෙවත් හෙක්ටයාර් 0.0476 ක් වූ ද දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එම් 2838/82 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

ඉහත කී කච්ඩාන පිහිටා ඇත්තා වූ ද "කොස්ගහවත්ත" යනුවෙන් හැඳින්වෙන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු වන සී. පීරසිංහ විසින් සාදන ලද 2004.05.05 දින අංක 2157 දරන පිඹුරේ ලොට් අංක 5 ලෙස ලකුණු කර ඇත්තා වූ ද (අඩි 10 ක් පළල මාර්ගයක්

සඳහා වෙන් කිරීමක් වූ) උතුරට : කව්ඩාන පාර ද, නැගෙනහිරට : මාර්ගය සහ ඩී. පෙරේරා මහතාගේ ඉඩම ද, දකුණට : ලොට් අංක 4 ද, බටහිරට : ලොට් අංක 1 සහ 4 ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද එකී අංක 2157 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 8.70) හෙවත් හෙක්ටයාර් 0.0220 ක් වූ දෙල්කඳ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එම් 3079/65 යටතේ ලියාපදිංචි වී ඇති බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ සියලු ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ දකුණ).

01-512

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

ගනුදෙනුකරුගේ නම : ඇල්ෆා ඩිජිටල් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ශාඛාව : නුගේගොඩ.

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2012.12.12 වැනි දින පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඇල්ෆා ඩිජිටල් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ආර්. හේවාතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද දෙකම 2009 ජූලි මස 10 දිනැති අංක 1776 සහ 1779 දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2012.10.01 වැනි දින දක්වා ගෙවිය යුතු මුදල් සහ පොළිය වශයෙන් රුපියල් දෙසිය විසි හත් ලක්ෂ තිස් තුන් දහස් එකසිය තිස් අටයි ශත හය (රු. 2,27,33,138.06) ක මුදල සහ 2012.10.02 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් රුපියල් දෙසිය දහ අට ලක්ෂ හැත්තෑ දෙදහස (රු. 21,872,000) ක මුදල මත වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් පොලිය ද,

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ.

ඒ කෙසේ ද යත් එකී අංක 1776 හා 1779 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් දෙසිය විසි හත් ලක්ෂ තිස් තුන් දහස් එකසිය තිස් අටයි ශත හය (රු. 2,27,33,138.06) ක මුදල ඉහත කී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද (යම් මුදලක් ගෙවා ඇතොත් එකී මුදල අඩු කිරීමෙන් පසුව) අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති වෙත එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය ටොරින්ටන් ඇවනිව් හි පිහිටි ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 290/1 දරන බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් 12 දිනැති සැලැස්මේ ලොට් ඒ වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති, ඊසානදිගට : ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 296, 296/1, 296/3 සහ 298 දරන පරිශ්‍රයන්, ගිණිකොනට : පාර (අංක 108/93 දරන සැලැස්මේ ලොට් සී), නිරිතදිගට : මෙම සැලැස්මේ ලොට් එෆ් සහ වයඹට : මෙම සැලැස්මේ ලොට් ඊ යන මායිම් තුළ පිහිටි පර්චස් නමයයි දශම එකයි දෙක (අ. 0, රූ. 0, පර්. 09.12) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියල්ල වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/155 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක ජී. චන්ද්‍රසේන විසින් මැන සාදන ලද අංක 108/93 සහ 1993 දෙසැම්බර් 20 දිනැති සැලැස්මේ ලොට් සී (පාර සඳහා වෙන් කරන ලද බිම් තීරය) මත සහ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය ටොරින්ටන් ඇවනිව් හි පිහිටි ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 290/4 දරන බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් 12 දිනැති සැලැස්මේ ලොට් බී වශයෙන් බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති ඊසාන දිගට : අංක 2002/210 සැලැස්මේ ලොට් ඒ2, ගිණිකොනට : මෙම සැලැස්මේ ලොට් ඊ, නිරිතදිගට : මෙම සැලැස්මේ ලොට් සී සහ වයඹට : පින්සිරිනි මාවතේ වරිපනම් අංක 1 දරන පරිශ්‍රය යන මායිම් තුළ පිහිටි පර්චස් නමයයි දශම එකයි දෙක (අ. 0, රූ. 0, පර්. 09.12) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියල්ල වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/157 හි ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ තිඹිරිගස්යාය කොට්ඨාස අංක 40 තිඹිරිගස්යාය ටොරින්ටන් ඇවනිව් හි පිහිටි ටොරින්ටන් ඇවනිව් වරිපනම් අංක 290/3 දරන බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2002 නොවැම්බර් 12 දිනැති සැලැස්මේ ලොට් සී වශයෙන් බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති ඊසානදිගට : මෙම සැලැස්මේ ලොට් බී, ගිණිකොනට : මෙම සැලැස්මේ ලොට් ඊ, නිරිතදිගට : මෙම සැලැස්මේ ලොට් ඊ සහ ඩී සහ වයඹට : පින්සිරිනි මාවතේ වරිපනම් අංක 1 සහ 2 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි පර්චස් නමයයි දශම එකයි දෙක (අ. 0, රූ. 0, පර්. 9.12) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සියල්ල වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1082/156 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක කේ. පී. විජේවීර විසින් මැන සාදන ලද අංක 2074 සහ 2012 නොවැම්බර් මස 12 දිනැති සැලැස්මේ ලොට් ඒ සහ ඊ (පාර

සඳහා වෙන් කරන ලද බිම් තීරය) මත සහ ඔස්සේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පොන්නයියා ධර්මරට්නම්,
කළමනාකරු- ණය අයකර ගැනීම්.

01-573

---

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 ඔක්තෝබර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කුරුණෑගල කොළඹ පාරේ අංක 100 දරන ස්ථානයේ ස්වකීය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය/ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන, 1990.03.08 දිනැති ලියාපදිංචි අංක A/16367 දරන විකෝ ලංකා ඉන්ටර්නැෂනල් ආයතනයේ තනි හිමිකරුවන අතුල ඉන්ද්‍රසෝම ජයවංශ නොහොත් අශෝක ජයවංශ යන අය වාර ණය පහසුකමක් ආකාරයෙන් කලින් කලට බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී අතුල ඉන්ද්‍රසෝම ජයවංශ නොහොත් අශෝක ජයවංශ යන අය ඉහත කී ණය පහසුකම නිසා යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී වෙත අයවිය යුතුව ඇති රුපියල් එක්කෝටි අනූනවලක්ෂ හැත්තෑපන්දහසක (රු.1,99,75,000) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සැන්ඩ්‍රා බෙවලී වඳුරාගල යන අය විසින් සහතික කළ, රුපියල් මිලියන 23 ක් සඳහා 2006.10.02 දිනැති අංක 13602 දරන උකස් බැඳුම්කරය ද, රුපියල් මිලියන 2.1 ක් සඳහා 2007.10.26 දිනැති අංක 14375 දරන උකස් බැඳුම්කරය ද, රුපියල් මිලියන 5 ක් සඳහා 2008.03.31 දිනැති අංක 14741 දරන උකස් බැඳුම්කරය ද ලියා අත්සන් කිරීමෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ක්‍රියාත්මකව පවත්නා ඇපයක් වශයෙන් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, අංක ටීඑල්6/11/861 දරන එකී වාර ණය පහසුකම මත 2012.04.30 වැනි දිනට හිඟ මුදල වශයෙන් රුපියල් එක්කෝටි හැත්තෑහයලක්ෂ හතළිස්දහස් පන්සියහැටඑකකුත් ශත දහයක (රු.1,76,40,561.10) මුදලක් සහ ඒ මත 2012.05.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් 29% බැගින් පොළිය ද ඉහත කී වාර ණය පහසුකම නිසා ඉහත කී අතුල ඉන්ද්‍රසෝම ජයවංශ නොහොත් අශෝක ජයවංශ යන අයගෙන් යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබෙන බැවින් ද,

යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය මගින් එකී යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී වෙත පවරා ඇති බලතල ප්‍රකාරව සහ ඊට යටත්ව ක්‍රියා කරමින් ඉහත කී ණය මුදල හෝ ඉන් කොටසක් ගෙවා පියවා දැමීම යථොක්ත බන්ධනදායී විසින් පැහැර හැර ඇති බවට සෑහීමකට පත්වීමෙන් ඉක්බිතිව, ඉහත කී වාර ණය පහසුකම මත 2012.04.30 වැනි දිනට හිඟ මුදල වන රුපියල් එක්කෝටි හැත්තෑහයලක්ෂ හතළිස්දහස් පන්සියහැට එකකුත් ශත දහයක (රු.1,76,40,561.10) මුදල සහ ඒ මත 2012.05.01 දින සිට 29% බැගින් පොළිය සහ ඉහත කී අංක 13602, 14375, 14741 දරන බැඳුම්කර සහ 1990 අංක 04 දරන ඉහත කී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී වෙත අයකර ගැනීමට හිමිකම් ඇති සියලුම වෙනත් වටිනාකම් අයකර ගැනීම සඳහා 2006.10.02 දිනැති අංක 13602 සහ 2007.10.26 දිනැති අංක 14375 සහ 2008.03.31 දිනැති අංක 14741 දරන උකස් බැඳුම්කරවල බලය පිට යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ 1990 අංක 04 දරන ඉහත කී පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරු හේමචන්ද්‍ර දළුවත්ත මහතාට බලය පැවරීමට 1990 අංක 04 දරන ඉහත කී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දාහේ කෝරළේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල මහනගර සභා සීමාව තුළ කොළඹ පාරේ පිහිටි, කොළඹ කුරුණෑගල පාරේ, වරිපනම් අංක 100 දරන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 2001.06.11 දිනැති පිඹුරේ අනුබෙදීමක් වන) අංක 22/91 සහ 1991.02.17 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 02B දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : එම් පිඹුරේ කැබලි අංක 2A ද, ගිණිකොනට: කොළඹ කුරුණෑගල ප්‍රධාන පාර ද, නිරිතට : අංක 22/91 දරන පිඹුරේ කැබලි අංක 2C ද, බස්නාහිරට : අබේවර්ධන මහත්මියගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 11.5) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1193/247 දරන හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දාහේ කෝරළේ, වැවුඩවිල්ලි හත්පත්තුවේ කුරුණෑගල මහනගර සභා සීමාව තුළ කොළඹ පාරේ පිහිටි, කොළඹ කුරුණෑගල පාරේ, වරිපනම් අංක 100 දරන, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද 2001.06.11 දිනැති පිඹුරේ අනුබෙදීමක් වන) අංක 22/91 සහ 1991.02.17 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 02B දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : එම පිඹුරේ කැබලි අංක 2B ද, ගිණිකොනට : කොළඹ - කුරුණෑගල ප්‍රධාන පාර ද, නිරිතට : අබේවර්ධන මහත්මියගේ ඉඩම ද, බස්නාහිරට : අබේවර්ධන මහත්මියගේ ඉඩම ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් නවයකුත් දශම අටක් (අ. 0, රූ. 0, පර්. 9.8) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පලතුරු, ගොඩැගිලි ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 1193/248 දරන හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

01-453

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2012.11.30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් එන්. ටී. පතිනායක විසින් සහතික කරන ලද 2011.06.20 දිනැති අංක 1402 දරන උකස් බැඳුම්කරය අනුව 2012.10.11 දින තෙක් පොළිය වශයෙන් රුපියල් අසූ නව ලක්ෂ හතලිස් පන්දහස් පන්සිය තිස් දෙකයි ශත අසූ පහක (රු. 89,45,532.85) මුදල සමග රුපියල් අසූ තුන් ලක්ෂ හතලිස් හය දහස් පන්සිය හැටයි ශත හැත්තෑ හයක (රු. 83,46,560.76) මුදල මත වසරකට 12% බැගින් පොලියක් ද, 2012.10.12 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පල්ලෙවෙල, සෙව්වන්දි හි පදිංචි රූපසිංහ ආරච්චිරාලලාගේ හර්ෂ සංජීව රූපසිංහ මහතා සහ ගස්පෙ රාලලාගේ ගාමිණී යන අයගෙන් එක්ව හා වෙන වෙනම අයවිය යුතුව ඇත.

2. මහජන නොතාරිස් එන්. ටී. පතිනායක විසින් සහතික කරන ලද එකී අංක 1402 හා 2011.06.20 දිනැති උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් අසූ නව ලක්ෂ හතලිස් පන්දහස් පන්සිය තිස් දෙකයි ශත අසූ පහක (රු. 89,45,532.85) මුදල සමග 2012.10.12 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, හි පදිංචි ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ මීරිගම ශාඛාවේ ශාඛා කළමනාකරු/අයකර ගැනීම් නිලධාරි හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළයේ, යටිගහපත්තුවේ (පල්ලේවෙල උපකාර්යාලයේ අංක 03) මීරිගම ප්‍රාදේශීය සභා සීමාවේ පල්ලෙවෙල ග්‍රාමයේ පිහිටි කාක්කැලේවත්ත නමැති ඉඩමට අයත් ගහකොළ, ගොඩනැගිලි හා එහි වැවෙන හා පිහිටි වෙනත් සියලු දේපල ඇතුළත්ව බලයලත් මිනින්දෝරු අයි. එම්. රංජිත් ඉලංගකෝන් විසින් සාදන ලද 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1168A දරන පිඹුරෙහි ලොට් 7B ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 7B, උතුරට : බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් සාදන ලද අංක 348/1996 දරන පිඹුරෙහි ලොට් 5 ද, නැගෙනහිරට : එකී අංක 348/1996 දරන පිඹුරෙහි ලොට් 6 ද, දකුණට: එකී අංක 348/1996 දරන පිඹුරෙහි ලොට් 8 හා 9 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු රංජිත් ඉලංගකෝන් විසින් සාදන ලද අංක 666 දරන පිඹුරෙහි ලොට් 7A ද මායිම්ව එකී අංක 1168A දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් පහලොවක (අ.0, රූ. 02, පර්. 15) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D360/224 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 7B පහත විස්තර කර ඇති ඉඩම් උප බෙදීමකි.

එකී පල්ලෙවෙල ග්‍රාමයේ පිහිටි කාක්කැලේ වතුයාය නමැති ඉඩමට එහි ඇති හා වැවෙන ගහකොළ ගොඩනැගිලි හා වෙනත් සියලු දේද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් සාදන ලද 1996 ජූනි 14 දිනැති අංක 348/1996 දරන පිඹුරෙහි ලොට් 7 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් ලොට් 7 උතුරට : එකී පිඹුරෙහි ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් 6 හා ලොට් 9 (පාරද), දකුණට : ලොට් 8 හා 9 ද, බස්නාහිරට : පාරද මායිම්ව එකී අංක 348/1996 දරන පිඹුරට අනුව අක්කර එකක (අ. 01, රූ. 0, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D360/69 හි ලියාපදිංචි කර ඇත.

ඒ සමග මෙයට එකී අංක 348/1996 දරන පිඹුරෙහි ලොට් 9 (මීටර් 4 ක් පළල) මතින් හා ඒ දිගටද පිඹුරු අංක 1168A හි නිරූපිත අනෙකුත් පාරවල්වල අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. කේ. එස්. එම්. හේරත්,
කළමනාකරු.

ලංකා බැංකුව,
මීරිගම ශාඛාව.

01-464

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

පී. වී. ටී. එම්. පෙරේරා සහ එච්. බී. ඒ. ඩී. පෙරේරා,
ගිණුම් අංක : 0061 5000 4088

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2012.08.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන්වන එන්. එස්. කලංසූරිය යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 27 දාතම හා අංක 438 දරන හා ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 පෙබරවාරි මස 28 දාතම හා අංක 990 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කෙට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොඩිමරක්කල විදානලාගේ ටිරෝන් මේරියන් පෙරේරා සහ හේවා බොරුප්පගේ අප්සරා දික්රුක්ෂි පෙරේරා විවාහයට පෙර කරුණාරත්න යන අය බන්ධනදායින් වශයෙන් හා එකී හේවා බොරුප්පගේ අප්සරා දිල්රුක්ෂි පෙරේරා විවාහයට පෙර

කරුණාරත්න යන අය උකස්කරු වශයෙන් ද, පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 438 සහ 990 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් අනූ හය ලක්ෂ පනස් හය දහස් හාරසිය තිහයි ශත පනස් හතරක (රු. 9,656,430.54) මුදලක් 2012 පෙබරවාරි මස 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අනූ හය ලක්ෂ පනස් හය දහස් හාරසිය තිහයි ශත පනස් හතරක (රු. 9,656,430.54) මුදල ද, 2012 පෙබරවාරි මස 28 වැනි දින සිට අංක 438 සහ 990 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට හතර ලක්ෂ හැත්තෑ හය දහස් තිස් අටක (රු. 6,476,038) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) හා තවත් රුපියල් විසි හත් ලක්ෂ තිස් තුන් දහස් තුන්සිය හතලිස් හයක (රු. 2,733,346) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 438 සහ 990 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසි කරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියා යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවත් තුළ බොරලැස්ගමුව ග්‍රාමයේ මහරගම පාරේ පිහිටි වරිපනම් අංක 123/12 දරන "කෝන්ගහවත්ත නොහොත් සම්බුද්ධිකෝන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. එන්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1999 මාර්තු මස 21 දාතම හා අංක 3367 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්නය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජී. චන්ද්‍රසේන පෙරේරා සහ වෙනත් අයගේ කොලයින්කුඹුර, නැගෙනහිරට : හේවා ගමගේ දියෝනිස් යන අයගේ දේපළ, දකුණට : චාන්දිනී කන්දගේ FG 3, අඩි 30 හැරෙන වටරවුම සහ අඩි 20 පළල පාර (ජී. සී. එම්. කරුණාරත්න විවාහයට පෙර පෙරේරා යන අයගේ ලොට් FG 10 සහ FG 2 සහ බස්නාහිරට : ජී. කේ. පෙරේරා සහ වෙනත් අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0 රූ. 0 පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3367 දරන පිඹුරට අනුව ය.

අංක 3367 දරන පිඹුරේ එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාවත් තුළ බොරලැස්ගමුව ග්‍රාමයේ මහරගම පාරේ පිහිටි වරිපනම් අංක 123/12 දරන "කෝන්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. එල්. නානායක්කාර යන අය විසින් සාදන ලද 1986 ජූනි 08 (1986.06.18 වශයෙන් ලියාපදිංචි කළ නමුත්) දාතම හා අංක 4108 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් FG 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: ජී. චන්ද්‍රසේන පෙරේරා සහ වෙනත් අයගේ කොලයින්කුඹුර, නැගෙනහිරට : වරිපනම් අංක 15/7 දරන තල්ගහවත්ත පාර, දකුණට : ලොට් FG 2, FG 3 සහ FG 10 සහ බස්නාහිරට : ජී. කේ. පෙරේරා සහ වෙනත් අයගේ දේපළ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0 රූ. 0 පර්. 18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන් පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4108 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව එම් 2425/276 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය :-

ලොට් FG 10 ඉහත කී පිඹුරු අංක 4108 දක්වා ඇති අතර වෙලුම/පත්ඉරුව M 2425/199 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-580

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2012 නොවැම්බර් මස 28 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1809 හා 2006 අගෝස්තු මස 24 වැනි දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කර ඇත්තා වූ ද, ලියාපදිංචි කාර්යාලය අංක 423, බොරලැස්ස පාර, බොරලැස්ස යන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) මින්ලි ක්‍රියේෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2012 ඔක්තෝබර් මස 31 වැනි දිනට ඉහත කී අංක 1809 දරන උකස් බැඳුම්කරය මත එකී මින්ලි ක්‍රියේෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි දොලොස් ලක්ෂ අනූදහස් තුන්සිය පනස් එකකුත් ශත දහනවයක (රු. 1,12,90,351.19) මුදලක් සහ 2012 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අනූපන්ලක්ෂ විසිතුන් දහස් හත්සිය හැටක් (රු. 95,23,760) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී, ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ සති දොළහේ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ

අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල රුපියල් එක්කෝටි දොලොස් ලක්ෂ අනූදහස් තුන්සිය පනස් එකකුත් ශත දහනවයක (රු. 1,12,90,351.19) මුදලක් සහ 2012 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අනූපන්ලක්ෂ විසිතුන් දහස් හත්සිය හැටක් (රු. 95,23,760) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ සති දොළහේ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ හා එහි පිහිටි වෙනත් සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 1809 දරන බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1809 දරන උකස් බැඳුම්කරය මගින් එකී මින්ලි ක්‍රියේෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ හා එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1809 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත බොරලැස්ස ග්‍රාමයේ පිහිටි කජුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක කේ. ඒ. ෆවුස්ටියස් ප්‍රනාන්දු මැන සකස් කළ අංක 5019/2003 හා 2006 ජූලි මස 07 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස නිරූපිත බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : එල්. අල්පොන්සු ප්‍රනාන්දුට කලින් අයිතිව තිබුණු දැනට ජී. ජී. ඊ. එම්. රුද්‍රිගුට අයිති ඉඩම ද, නැගෙනහිරට : යූ. ඇල්බිනෝ පෙරේරාට සහ ඩබ්ලිව්. එම්. ඉයුජිනු ප්‍රනාන්දුට සහ තවත් අයට කලින් අයිතිව තිබුණ ඉඩම ද, දකුණට : කේ. ලෝරන්ස් පෙරේරාට කලින් අයිතිව තිබුණු දැනට සල්වතුරට සහ සී. එම්. බී. අයිරාන්ගනී සල්වතුරට අයිති ඉඩම ද. බස්නාහිරට : මහ පාර ද යන මායිම් ඇතුළත එකී අංක 5019/2003 පිඹුර ප්‍රකාර අක්කර එකකුත්, රූඩ් එකකුත්, පර්චස් දොළහයි දශම අටයි පහක් (අ. 1, රූ. 1, පර්. 12.85) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

ඉහත විස්තර කර තිබෙන අංක 5019/2003 පිඹුරේ ලොට් අංක 1 ලෙස නිරූපිත ඉඩම මෙහි පහත සවිස්තරව විස්තර කරන ඉඩම නැවත මැනීමක් වේ :-

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත බොරැලැස්ස ග්‍රාමයේ පිහිටි කජුගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක ඒ. එම්. පෙරේරා මැන සකස් කළ අංක 3270 හා 1948 අගෝස්තු මස 31 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : එල්. අල්පොන්සු ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : යූ. ඇල්බිනෝ පෙරේරාට අයිති ඉඩම සහ ඩබ්ලිව්. එම්. ඉයුජිනු ප්‍රනාන්දුට සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : කේ. ලෝරන්ස් පෙරේරාගේ ඉඩම සහ බස්නාහිරට : බෝලවත්ත ලුණුවිල පාර ද යන මායිම් ඇතුළත එකී අංක 3270 දරන පිඹුර ප්‍රකාර අක්කර එකකුත් රූඩ් එකකුත් පර්චස් දහහතක් (අ. 1, රූ. 1, පර්. 17) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ. මෙම ඉඩම මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

***උකස් කරන ලද යන්ත්‍රෝපකරණ විස්තරය***

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| ස්කෝර්ච් (Schorch) බේලිං මැෂින් 2500 HP ප්‍රෙස් | 01 |
| මෆල් MD NR - 1201062/1 MD NRK 7988Z16 ස්ටාටරය | 01 |
| ලින්ඩෙමාන් ප්‍රෙස් - ජර්මන් | 01 |
| එෆ්එම්ටී මැෂින් - ෆයිබර් ක්ලිනිං මැෂිම සහිත | 03 |
| වේ බ්‍රිජ් - 760KVA ජොන්සන් | 01 |

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-458

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2012 නොවැම්බර් මස 28 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. යූ. කැප්පෙටිපොල විසින් ලියා සහතික කරන ලද අංක 19701 හා 2003 ජනවාරි මස 23 වැනි දින මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. හපුතන්ත්‍රි විසින් ලියා සහතික කරන ලද අංක 218 හා 2006 මාර්තු මස 03 වැනි දින ද, අංක 453 හා 2007 අගෝස්තු මස 01 වැනි දින ද, අංක 680 හා 2009 මාර්තු මස 19 වැනි දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, "නිමාලි ගාමන්ට්ස් " යන නාමය අභිධානය සහ ආයතනය යටතේ මහනුවර, සියඹලාගස්තැන්නේ, සියඹලාගස්තැන්න පාර, අංක 24/10 දරන ස්ථානයේ ව්‍යාපාරය පවත්වාගෙන යන කොඩිතුවක්කු ආරච්චිලාගේ පද්මිණී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2012 ජුනි මස 30 වැනි දිනට ඉහත කී කොඩිතුවක්කු ආරච්චිලාගේ පද්මිණී යන අයගෙන්

ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැටතුන් ලක්ෂ අසූඅට දහස් දෙසිය හතලිස් දෙකකුත් ශත හැත්තෑ හතක (රු. 63,88,242.77) මුදලක් සහ 2012 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ තිස්එක් දහස් දෙසිය හතලිස් දෙකකුත් ශත හතලිස් එකක් (රු. 6,31,242.41) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය ද, රුපියල් නවලක්ෂ විසිතුන්දහස් අටකුත් ශත විසිපහක මුදලක් (රු. 9,23,008.25) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් පන්ලක්ෂ හතලිස් එක් දහස් හයසිය පණස් දෙකක් 6රු. 5,41,652) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට එකොළහක (11%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද, ඩීඑෆ්සීසී බැංකුවට ලැබිය යුතු සමස්ත මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන දිනය දක්වා රුපියල් විසිපන් ලක්ෂයක (රු. 25,00,000) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක තැන්පතු පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්ඩීආර්) වර්ෂයකට සියයට දොළහකුත් දශම පහක් (12.5%) ඉහළ අනුපාතිකයක් මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල රුපියල් හැටතුන් ලක්ෂ අසූඅට දහස් දෙසිය හතලිස් දෙකකුත් ශත හැත්තෑ හතක (රු. 63,88,242.77) මුදලක් සහ 2012 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හයලක්ෂ තිස්එක් දහස් දෙසිය හතලිස් දෙකකුත් ශත හතලිස් එකක් (රු. 6,31,242.41) සඳහා වර්ෂයකට සියයට දහතුන (13%) බැගින් පොලිය ද, රුපියල් නවලක්ෂ විසිතුන්දහස් අටකුත් ශත විසිපහක මුදලක් (රු. 9,23,008.25) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් පන්ලක්ෂ හතලිස් එක් දහස් හයසිය පනස් දෙකක් (රු. 5,41,652) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික අතරින් එනම්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට එකොළහක (11%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද, ඩීඑෆ්සීසී බැංකුවට ලැබිය යුතු සමස්ත මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන දිනය දක්වා රුපියල් විසිපන් ලක්ෂයක (රු. 25,00,000) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක තැන්පතු පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්ඩීආර්) වර්ෂයකට සියයට දොළහකුත් දශම පහක් (12.5%) ඉහළ අනුපාතිකයක් මත පොලිය ද හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 218, 453, 19701 හා 680 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී කොඩිතුවක්කු ආරච්චිලාගේ පද්මිණී මහත්මිය ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 218, 453, 19701 හා 680 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

මධ්‍යම පළාතේ, මහනුවර මහනගර සභා සීමාව ඇතුළත සියඹලාගස්තැන්නේ පිහිටි. එගොඩවත්ත, හපුගහමුලවත්ත, අඹගහකොටුව වත්ත, ගෙදරවත්ත නොහොත් වෙදගෙදරවත්ත, මහමුදියන්සේලාගේ ගෙදරවත්ත, අස්පොකුණේවත්ත සහ පල්ලෙගෙදරවත්ත යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ (බලයලත් මානක කේ. එම්. එච්. නවරත්න මැන සකස් කළ අංක 10070/1 හා 1987 ජූලි මස 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 5 ලෙස සහ බලයලත් මානක සී. පාලමකුඹුර මැන සකස් කළ අංක 2222 හා 1989 ජනවාරි මස 8 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 4A ලෙස ලකුණු කළ බිම් කොටස් ඒකාබද්ධ කර නැවත මැනීමක් වන) බලයලත් මානක ඊ. එස්. අයි. රාජකරුණා මැන සකස් කළ අංක 1502 හා 2005 ජනවාරි මස 12 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : බලයලත් මානක කේ. එම්. එච්. නවරත්න මැන සකස් කළ අංක 10070/1 පිඹුරේ ලොට් අංක 6 වෙන් වන බිත්තිය ද, නැගෙනහිරට : බලයලත් මානක සී. පාලමකුඹුර මැන සකස් කළ අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 4 වෙන් වන බිත්තිය ද, දකුණට : පාර සහ බස්නාහිරට සහ දකුණු-බස්නාහිරට : කොටුවේගෙදර කුඹුර වෙන්වන බිත්තිය ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 1502 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයකුත් දශම තුනයි හතයි පහක් බිම් ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 9.375) නොහොත් හෙක්ටෙයාර් 0.02371ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

01-457

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.